# හාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
## திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
## Department of Treasury Operations

තැ.පෙ. 1559, මහා භාණ්ඩාගාරය, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
தபெ. 1559,பொது திறைசேரி, நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசிய கொள்கைகள் அமைச்சு, கொழும்பு 01, இலங்கை
P.O.Box: 1559, General Treasury, Ministry of Finance, Economic Stabilization & National Policies, Colombo 01, Sri Lanka

| කාර්යාලය / அலுவலகம் / Office | දුරකථන / தொலைபேசி / Telephone | +94 11 2484600<br>+94 11 2484700 | ෆැක්ස් / பெக்ஸ் / Fax | +94 11 2484970<br>+94 11 2320042 | වෙබ් අඩවිය / இணையதளம் / Website | www.treasury.gov.lk |
|---|---|---|---|---|---|---|


| මගේ අංකය / எனது இல / My No. | TO/GR /Miscellaneous(iii) | ඔබේ අංකය / உமது இல / Your | | දිනය / திகதி / Date | 2024.11.25 |
|---|---|---|---|---|---|

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන් හා
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

**<u>දේශීය හා විදේශ ප්‍රදාන සඳහා අක්මුදල් ඉල්ලීම්</u>**

2024 වර්ෂයට අදාලව ගිණුම් පියවීමේ කටයුතු 2024.12.31 දිනෙන් අවසන් වන බැවින්, මූල්‍ය සංකේත අංක 13 (විදේශ ප්‍රදාන) හා මූල්‍ය සංකේත අංක 11(දේශීය ප්‍රදාන) යටතේ ප්‍රතිපාදන සලසා ඇති, දේශීය හා විදේශ ප්‍රදාන වැය විෂයන්ට අදාල සියළුම අක්මුදල් ඉල්ලීම් 2024.12.24 දින හෝ ඊට ප්‍රථමව මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි. එම දිනට පසුව ලැබෙන දේශීය හා විදේශ ප්‍රදාන අක්මුදල් ඉල්ලීම් සඳහා මෙම වර්ෂය තුලදී අක්මුදල් නිදහස් කිරීමට කටයුතු කරනු නොලබන බව කාරුණිකව දන්වා සිටිමි.

එසේම, විදේශ ආධාර ගිණුම් තැබීම සම්බන්ධයෙන් වූ 1994 අප්‍රේල් 20 දිනැතිව නිකුත් කරන ලද අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරමින් විදේශ ආධාර සම්බන්ධයෙන් සියළුම වියදම් වාර්තා ඉහත චක්‍රලේඛයේ ආකෘති ප්‍රකාරව 2025.01.10 දින හෝ ඊට ප්‍රථමව ලැබෙන සේ මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස ද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

තවද, 2024 වර්ෂයේ ගිණුම් පියවීමට අදාලව නිකුත් කර ඇති අංක 06/2022 හා 2024.11.04 දිනැති මෙම දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයට අනුගත වෙමින්, 2024 වර්ෂයේ අක්මුදල් ඉතිරිවීම් ආපසු ප්‍රේෂණය කිරීමේදී දේශීය හා විදේශ ප්‍රදාන අක්මුදල් ඉතිරිවීම් පිළිබඳ තොරතුරු, මෙම දෙපාර්තමේන්තුවේ දේශීය හා විදේශ ප්‍රදාන අංශයට පිටපතක් ද සහිතව යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

ඒ.එන්.හපුගල
අධ්‍යක්ෂ ජනරාල්